1.) 1.1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ව්‍යවස්ථාදායකය හැඳින් වූ නිල නාමය කුමක්ද?
2.එහි නිල කාලය කොපමණද?

2.) නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුළ ජනතා නියෝජිතයින් තෝරා පත් කර ගැනීම සඳහා භාවිතයට ගැනෙන මැතිවරණ ක්‍රම දෙකක් තිබේ.එම දෙක නම් කරන්න.

3.) රාජ්‍යයක ස්වාධිපත්‍ය බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව ආණ්ඩුක්‍රම කොටස් දෙකකට වර්ග කරනු ලැබේ.එම කොටස් දෙක නම් කරන්න.

4.) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවට නැංවීම පිළිබඳ ප්‍රතිපත්ති චක්‍රය අවධි හතකින් සමන්විත වේ.එහි මුල් අවධි දෙක පිළිවෙලින් සඳහන් කරන්න.

5.) දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ,
1.රජයේ ඉහළ තනතුරුවලට පත්කිරීම සඳහා ජනාධිපතිවරයාට නිරීක්ෂණ සැපයීම පිණිස සංස්ථාපනය කළ සභාවේ නිල නාමය කුමක්ද?
2.එම සභාවේ සාමාජික සංඛ්‍යාව කොපමණද?

6.) දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් බලතල බෙදා ඇත්තේ ලැයිස්තු තුනක් යටතේය.ඉන් දෙකක් නම් කරන්න.

7.) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය අධිපති ද්විපක්ෂ ක්‍රමයක් ලෙස හඳුන්වනු ලැබේ.එම අධිපති පක්ෂ දෙක නම් කරන්න.